**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**විෂය-නර්තනය**

**දෙවන වාරය - ජූනි - සතිය - 03**

**ශ්‍රේණිය-9**

**සැකසුම:-එම්.කේ.සී දිල්රුක්ෂි මිය**

**ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය, කරවිට**

**1.පාඩම හෝ ඒකකය** :-1.2 'ශෝකය' නැමති ස්ථායී භාවය නිරූපණය කරමු.

**2.ශිෂ්‍යා කළ යුතු කාර්යන් :-**

- ශෝකය නමැති ස්ථායී භාවය ප්‍රකාශ වන සංගීත කණ්ඩ,කථා පුවතක් ඇසීමට හා බැලීමට යොමු වන්න. එයින් ශෝකය නැමති ස්ථායී භාවය හඳුනා ගත හැකිවේ.
- ශෝකය නැමති ස්ථායී භාවය ඉස්මතු කල හැකි අවස්ථා හඳුනා ගැනීම හා එහි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- ශෝකය නමැති ස්ථායී භාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් නිර්මාණය කරන්න.
- එම චරිත වලට අදාල චලන නිර්මාණය කරන්න.
- භාවය ප්‍රකාශ වන පරිදි චරිතය නිරූපණය කිරීමට හුරු වන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත් පත් ,website ,LMS ,පාඩම් හා ඉගෙනුම් ආධාරක :**

- **e-තක්සලාව**
- **e-නැණපියස-09 ශ්‍රේණිය**
- **you Tube-පටාචාරා මුද්‍රා නාට්‍ය/කරදිය වැනි නාට්‍ය වල කොටස්**
- **කියවීම් පත්‍රිකාව:-**

**පහත අවස්ථා උදාහරණ ලෙස ගත හැකිය.**

- පටාචාරා කථාවේ පටාචාරගේ ශෝකය
- විජය රජු කුවේණිය පලවා හැර දැමූ විට කුවේණියගේ වියෝ දුක





- ප්‍රියයන්ගෙන් වෙන් වීම.
- විපතක් සිදු වීම.
- ඇළුම් කල දෙයක් අහිමි වීම.
- වධ හිංසාවට ලක් වීම.





## කියවීම් පත්‍රිකාව

ඔබ මෙම සිද්ධීන් තව දුරටත් අධ්‍යනය කරන්න.

- ❖ කළයක් ගෙන වතුර ගෙන ඒමට යන ගැහැණු ළමයෙකි. හදිස්සියේ පය පැටලී වැටී කළය බිදෙයි..(කළය බිඳුණු අවස්ථාව)
- ❖ ඔරුවක නැග මුහුදු ගිය තම පුතා එනතුරු තම මව බලා සිටියි.(ඔරුව මුහුදු බත් වී පුතා මිය ගිය බව දක්නට ලැබුණු අවස්ථාව)
- ❖ ඔවක් තම දරුවා සුරතල් කරමින් සිටී. නොසිතූ ලෙස දරුවා නිවසේ දමා දුර ගමනක් යාමට සිදු වේ.(දරුවාගෙන් වෙන්ව යන මවට ඇතිවන ශෝකය)
- ❖ කුමාරිකාවක් මල් නෙළමින් වනයේ සැරිසරයි. හදිස්සියේ කටුවක් ඇනීමෙන් ඇය වේදනාවට පත් වේ.(කටුවක් ඇනී වේදනාවට පත්වන අවස්ථාව)
- ❖ ධීවරයෙක් මාළු ඇල්ලීම සඳහා ඔරුවක් දියත් කරයි. වෙහෙස මහන්සියෙන් ඔහු මුහුදේ දැලක් එලයි.එක දු මාළුවෙකුවත් දැලට හසු නොවී අපේක්ෂා භන්ගත්වයට පත් වේ. (මාළුවන් නොමැතිව හිස් වූ දැල දැක ශෝකයට පත් වන ධීවරයා)

- **පොත් පත් /සඟරා**
  අතිරේක කියවීම් අත්පොත(ජාතික අධ්‍යාපන ආයතනය)
  ඥානසිරි පීරිස් මහතාගේ 9 ශ්‍රේණිය නර්තනය කෘතිය
  භරත මුණිගේ රස භාව සංකල්පය

**4.මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵලඃ-**

- ශෝකය නමැති ස්ථායී භාවය දක්නට ලැබෙන අවස්ථා නම් කරයි.
- ශෝකය නමැති ස්ථායී භාවය ප්‍රකාශ  කර ආකාරය විස්තර කරයි.
- සුදුසු සිද්ධියක් නිර්මාණය කරයි.
- සිද්ධියෙහි චරිතවලට අදාළ චලන නිර්මාණය කරයි.
- නිර්මාණය කරගත් චලන භාවිත කරමින් චරිත නිරූපණය කරයි.
- ඉදිරිපත් කරන ලද නිර්මාණය පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.

**5.ඇගයීම/තක්සේරුකරණ ක්‍රමවේදඃ-**

1.ශෝකය නමැති ස්ථායී භාවය නිරූපණය වන අවස්ථා නම් කරන්න.

2.මෙම භාවයෙන් උපදින රසය කුමක්ද?

3.එම ස්ථායී භාවයෙන් නිරූපණය කල හැකි සිද්ධි දෙකක් ගොඩ නගන්න.

4.භාවය ප්‍රකාශ වන ලෙස ශෝකය නමැති ස්ථායී භාවන ප්‍රදර්ශනය කරන්න.

**සැකසුමඃ-** **එම්. කේ. සී. දිල්රුක්ෂි මිය**

**ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය**